// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2079/80 - 2018 ජූලි මස 13 වැනි සිකුරාදා - 2018.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KEG/LAN/AQUIS/A3/1/100.

කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙරගල ග්‍රාම නිලධාරී වසමෙහි ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා අවශ්‍ය අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි අත්පත් කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 52ඒ බෙරගල ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටි, කෑගල්ල මැනුම් අධිකාරිගේ අංක මු.පි.කෑ. 3591 දරන පිඹුරේ අමුණා ඇති උපලේඛනයේ සඳහන් ඉඩම් කැබලි 01ක් වේ.

*පරීක්ෂණ දින* : මු.පි.කෑ. 3591හි කැබලි අංක 01හි - 2018.08.23 වෙනි දින පෙ.ව. 9.30 සිට

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ ඉහත සඳහන් දිනයේ දී හා වේලාවේදී කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 අගෝස්තු මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්පත් කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. ටී. ආර්. නාලිකා පියසේන,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කෑගල්ල.

2018 ජූලි මස 10 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

---

**කෑගල්ල ජල සම්පාදන ක්‍රමයේ ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අත්කර ගැනීම**

**උපලේඛනය - මු.පි.කෑ. 3591**

**කැබලි අංක 01**

ඉඩමේ නම: බෙලිගහමුල වත්ත සහ ගංගොඩ වත්ත; හිමිකම් පාන්නාගේ නම හා ලිපිනය: ජී. ඩී. සිරිසේන, ඒ6, බෙරගල පාර, ගංගොඩ, කෑගල්ල; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0150.

07 - 969

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1A - G 28090 - 27 (2018/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.